# මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 7 වන සභා වාරයේ
# 2025.10.14 වන දින පැවති 5 වන මාසික මහා සභාවේ
# රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
- ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
- ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා
- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා
- ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා
- ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා
- ගරු මන්ත්‍රී පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මිය
- ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය
- ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය
- ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා
- ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

නොපැමිණි :- - ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2025 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීම 2025.10.14 වන දින ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව 9.30ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේ සභා රැස්වීම් ශාලාවේදී ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු සභාපතිතුමා විසින් 2025 සැප්තැම්බර් මස 09 වන දින පවත්වන ලද මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියෙව්වා සේ සලකා ලියා ඇති පරිදි හෝ සංශෝධන සහිතව සම්මත කරන ලෙස යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා විසින් 2025.09.09 දින පවත්වන ලද මාසික සභා වාර්තාවේ සංශෝධනයන් නොමැති බැවින් සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරන ලදී.ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2025.09.09 දින පැවති මාසික මහා සභා වාර්තාව සශෝධන රහිතව පැමිණ සිටින සභිකයන්ගෙන් ඒකමතිකව සභා සම්මත විය.

## 02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන

ගරු මන්ත්‍රී හශිත සුබෝදන මාරතුඩුවගේ මහතා අසනීප හේතුවෙන් අද දින මහා සභා රැස්වීමට නොපැමිණෙන බව දන්වා තියනවා.

## 03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම

- "කිලෝමීටර් ලක්ෂයේ වැඩසටහන යටතේ සෙන්ට්‍රල් පාර්ක් ගැමුණු මාවත මාර්ගය සංවර්ධනය කිරීම නිසා එස්.එන්.සමරවික්‍රම මහත්මියගේ නිවස අනාරක්ෂිත තත්ත්වයට පත්වීම වැලැක්වීම"යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

ඉහත සඳහන් මාර්ගය සංවර්ධනය කිරීමේදී එස්.එන්.සමරවික්‍රම මහත්මියගේ නිවස අනාරක්ෂිත තත්ත්වයට පත්වී ඇති බවත් නිවසට අදාළ ප්‍රමාණයට පැති බැම්ම ඉදි කිරීම සුදුසු බවත් ඒ සඳහා විරෝධයක් නොමැති බවත් සඳහන් කරමින් ගම්වාසීන්ගේ අත්සන් ලේඛණයක් සහිතව පාලිත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු තියනවා.මේ කාරණාව සම්බන්ධව උපසභාපතිතුමාට කලින් ලැබුණු ලිපියක් තිබුණා පැති බැම්ම ඉදිකිරීම අවශ්‍ය නෑ කියලා විරෝධය පළ කරලා.ඒ නිසා මේ සම්බන්ධව ස්ථානීය පරීක්ෂණයකින් පසු අවශ්‍ය කටයුතු පසුව සිදු කරමු.

- "හොරගොඩ ප්‍රජා ශාලාවේ විදුලි බිල් ගෙවීම සම්බන්ධවයි"යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

උදය සාන්ත මන්ත්‍රීතුමා විසින් මේ ලිපිය එවලා තියනවා.ප්‍රජා ශාලාවේ පවත්වාගෙන ගිය පෙර පාසල දැනට වසා දමා ඇති බැවින් විදුලි බිල ගෙවීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති බවත් විදුලිය ලබා ගැනීම පුද්ගලික මුදලින් ලබා ගත්තත් සභාවේ නමින් විදුලි බිල තියන නිසා සභාව විසින් විදුලිය ගෙවීම සිදු කරන ලෙස ඉල්ලීමක් කරලා තියනවා.

- "ප්‍රජා ජල ව්‍යාපෘති කාර්යාල පහසුකම් ලබා ගැනීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

හොරගොඩ සමඟි ප්‍රජා මූල සංවිධානය විසින් මේ ලිපිය එවලා තියෙන්නේ.එහි සභාපති විදියට කටයුතු කරන්නෙත් උදය සාන්ත මන්ත්‍රීතුමා.පවුල් 160කට පමණ මේ ජල ව්‍යාපෘතියෙන් ජලය සැපයීම සිදුවන බවත් කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට කාර්යාලයක් නොමැති බවත් දන්වා තියෙනවා.හොරගොඩ ශ්‍රී වර්ධනාරාම විහාරස්ථාන භූමියේ සභාව සතු ප්‍රජා ශාලාවේ ප්‍රයෝජනයට නොගන්නා කාමර 02න් එකක් මේ කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ඉල්ලීමක් කරනවා.එහිදී ප්‍රජා ශාලාවේ විදුලි බිල ගෙවීම ප්‍රජා ජල ව්‍යාපෘතියෙන් සිදු කරන්නට හැකි බවත් දන්වා සිටිනවා.ඒ ලිපි දෙකම සැලකිල්ලට ගෙන මේ ව්‍යාපෘති කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ප්‍රජා ශාලාවේ කාමරයක් ලබා දීමට කටයුතු කරනවා.

- "මාර්ගයට නාම පුවරුවක් සවි කිරීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
සුල්තානාගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමට අයත් වැලිගම මාතර මාර්ගය අසල කැකිල්ල පලේවිල මාර්ගයේ නාම පුවරුවක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර ඉල්ලා ලිපියක් එවලා තියනවා.පාරට අවහිර නොවන ලෙස නාම පුවරුව සවි කිරීමට අවසර ලබා දෙන බව සඳහන් කරමින් ලිපියකින් දැනුම් දීම සිදු කරමු.

- "කඩ කාමරය අලුත්වැඩියා කිරීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
නො 9 කැබැල්ල,හොරගොඩ කඩපල ලිපිනයේ වෙළඳ ව්‍යාපාරයක් සිදු කරන පී.ආර්.වසන්ත කුමාර මයා විසින් ව්‍යාපාර ස්ථානයේ වහළය අබලන් වී ඇති බවත් වෙළඳ කටයුතු සිදු කිරීමට බාධාවක් බවත් සඳහන් කරලා ලිපියක් එවලා තියනවා.එහි අලුත්වැඩියා කටයුතු තාක්ෂණ නිලධාරී මහතාගේ අධීක්ෂණය මත සිදු කිරීමට කටයුතු කරමු.

පෙ.ව 9.45ට ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය,ගරු මන්ත්‍රී පී.ජී.බසින්දා පුෂ්පමාලි මිය, ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය,ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා,ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

## 04. යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.

## 05. යථා පරිදි කල්දී ඇති යෝජනා

**<u>යෝජනා අංක 5:1</u>**
2025.08.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.08.21 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:2</u>**
2025.09.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.09.02 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:3</u>**

2025.09.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.09.23 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:4</u>**

2025.08.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.08.04 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපතිතුමා විසින් 5:5 යෝජනාව ඉල්ලා අස් කරගන්නා ලදී.**

**<u>යෝජනා අංක 5:6</u>**

2025.08.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.08.21 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

2025.08.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.08.27 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

පෙ.ව 9.50ට ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**ගරු සභාපතිතුමා විසින් 5:8 යෝජනාව ඉල්ලා අස් කරගන්නා ලදී.**

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීම (පෙ.ව 9.55)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

කමිටු වාර්තා පිළිබඳව කාරක සභාවේදී සාකච්ජා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීම (පෙ.ව 10.20)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

**<u>යෝජනා අංක 5:9</u>**
2025.09.08 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ජන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.09.08 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:10</u>**
2025.09.12 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ජන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.09.12 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපතිතුමා විසින් 5:11 යෝජනාව ඉල්ලා අස් කරගන්නා ලදී.**
**ගරු සභාපතිතුමා විසින් 5:12 යෝජනාව ඉල්ලා අස් කරගන්නා ලදී.**

**<u>යෝජනා අංක 5:13</u>**
2025.09.25 දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.09.25 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:14</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය සඳහා හලර් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් අංගනය සඳහා හලර් යන්ත්‍රයක් මිලදී ගැනීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:15</u>**
වෙළඳගොඩ ගමගේවත්ත පාර සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු සභාපතිතුමනි,ගැසට් එකේ නැති පාරක් වුනොත් අධිභාර වන නිසයි මං අහන්නේ.ගමගේ වත්ත පාර එක පැත්තකින් බෝගහ ළඟින් ඉවරවනවා.කන්ද උඩින් අමිලලාගේ ගෙදර ළඟින් කන්ද උඩටම අවසානය තෙක් තියනවා.පැති බැම්මක අවශ්‍යතාවයත් තියනවා.පාරේ මීටර් 150ක් වගේ දුරක් තමයි තියෙන්නේ.ඔය පාර මොන පැත්තටද හදන්නේ කියලා දැනගන්න කැමතියි.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
මාතර අකුරැස්ස පාරේ ඉදලා වසන්ත මහත්මයාගේ නිවස දක්වා මාර්ගය තමයි මේ කියන්නේ.මේ පාරේ දෙපැත්තෙන්ම හදන්න අවශ්‍යතාවය ඇති.තාක්ෂණ නිලධාරී ගිහින් තමයි තීරණය කරන්නේ පැති බැම්මක් අවශ්‍යද බෝක්කුවක් අවශ්‍යද යන කාරණාව.සංවර්ධනය කියන එක ඇතුළෙ ඒ සියලු කාරණා තියනවා.

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව වෙළඳගොඩ ගමගේවත්ත පාර සංවර්ධනය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:16</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>**
ගරු සභාපතිතුමනි,2026 අයවැය යෝජනාවලිය වඩාත් සවිස්තරාත්මකව සාකච්ජා කිරීම සඳහා වෙනත් දිනයකදී විශේෂ සභාවක් යටතේ සාකච්ජා කරමු කියලා මං ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
වෙනත් දිනයක අවශ්‍යතාවයක් නෑ කියලා මං විශ්වාස කරන්නෙ.අද දවස ඒ වෙනුවෙන් කැප කරලා අද දවස මදි නම් පමණක් වෙනත් දවසකට යමු.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**
ගරු සභාපතිතුමනි,තව දවසකට කල් තියනවා කියන්නේ කාලය ශ්‍රමය නාස්ති කිරීමක් ඒ නිසා අද දවස උපරිම මේ වෙනුවෙන් කැප කරලා අයවැය යෝජනාවලිය පිළිබඳ කතා කරමු.

**<u>ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා</u>**
ගරු සභාපතිතුමනි,තවත් දවසකට කල් දාන්න අවශ්‍ය නෑ.අද දවසේ මේ පිළිබඳ සාකච්ජා කරමු.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>**
ගරු සභාපතිතුමනි,නැවත වතාවක් කතා කරන්න අවස්ථාව දීම සම්බන්ධව ස්තූතියි.අපි මහජන සේවයට කැපවෙලා ඉන්නවා.ඒ නිසා අද දවස විතරක් නෙවෙයි 2026 කියන්නේ අපිට ඉතාම සුවිශේෂීයි.මේ සභා වාරයේ මංගල අයවැය වගේම සභාපතිතුමාගේ මංගල අයවැය.යෝජනා 35ක් තියන සභාවක කතා කළයුතු දෙයක් නෙවෙයි 2026 අයවැය කියන්නේ.සම්පූර්ණ ලබන අවුරුද්දෙ සංවර්ධන ක්‍රියාවලිය,ප්‍රගතිය 2026 අයවැයේ කතා කරන්න ඕන.පසුගිය සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරු 4 දෙනයි ඉන්නේ.අනිත් සියලු දෙනා නවක මන්ත්‍රීවරු.මේ පිළිබඳ අධ්‍යයනය කරන්න ඕන කාලය නැහැ කියන්න බැහැ මිනිසුන් වෙනුවෙන් වැඩ කරන්න කතා කරන්න අපිට වෙලාව තියෙන්න ඕන.මං නැවත වතාවක් ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා විශේෂ සභා වාරයක් කැඳවන්න කියලා.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු සභාපතිතුමනි,ඔබතුමාගේත් මෙවර සභාවේත් මංගල අයවැය මේක.ඒ නිසා තමයි හර්ෂණී මන්ත්‍රීතුමිය ඒ යෝජනාව කළේ.ඒ නිසාමයි මාත් ස්ථිර කළේ.ඒ වගේම තමයි අයවැය කෙටුම්පත කලින් සාකච්ජා කරලා තමයි අයවැය ලේඛණය සභාවේදී සාකච්ජා කළේ.අයවැය කෙටුම්පතක් පිළිබඳ කිසිදු දිනෙක සභාවේදී සාකච්ජා වුනේ නෑ.මේ ආදායම් වියදම් පිළිබඳ අදහස් ප්‍රකාශ කරන්න අපිටත් අවස්ථාවක් අවශ්‍ය වනවා.මන්ත්‍රීවරු අයවැය යෝජනාවලියට යෝජනා භාර දුන්නත් ඒවා ගමේ ක්‍රියාත්මක නොවුණත් අයවැය යෝජනාවට හරි ඇතුළත් වෙයි කියලා බලාපොරොත්තුවෙන්

හිටියා.පෙර පැවති සභාවල අයවැය කෙටුම්පතක් සාකච්ඡා කරලා අයවැය සාකච්ඡා කරපු නිසා අවස්ථාවක් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

මන්ත්‍රීවරුනි,අද දවස කතා කරලා අවසන් කරන්න බැරි වුනොත් වෙනත් දවසකත් කතා කරලා අයවැය අවසන් කරමු.කෙටුම්පත් අපි මුදල් කමිටුවට ඉදිරිපත් කළා අද දින අයවැය කතා කරන්න වෙන් කරලා තියනවා.ඔබතුමාලට අවස්ථාව තියනවා මේක සුදුසු නෑ කියලා පිළිගන්නත්.ඒක ඔබේ අයිතිය.බෙදීමක් අවශ්‍ය නම් ඒ වෙනුවෙනුත් අවස්ථාව තියනවා.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**

ගරු සභාපතිතුමනි,අද දින අයවැය පිළිබඳ කතා කළ යුතුයි.අද දවස මදි වුණොත් තවත් දවසක් ඉල්ලීම සාධාරණයි.

**<u>ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය</u>**

ගරු සභාපතිතුමනි,මමත් කියන්නේ මේ පිළිබඳ තවත් අධ්‍යනයක් කරන්න ඕන.ඒ නිසා තවත් දවසකට කල් දාමු කියලා මාත් ඉල්ලීමක් කරනවා.

**<u>ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා</u>**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි.මංගල අයවැය නිසා හර්ෂණී මන්ත්‍රීතුමිය කිව්ව වගේ මේ පිළිබඳ තවත් කියවලා තේරුම් අරගෙන එන්න තමයි උත්සාහ කලේ.යම් යම් අඩුපාඩු තියන බව පෙනී යනවා ඒ නිසා මාත් ඉල්ලිමක් කරන්න කැමතියි තවත් දිනයකට මෙය කල් තියන්න කියලා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

අයවැය ලේඛනය කල්වේලා ඇතිව එවලා තියනවා.අඩුපාඩු තියනවා නම් සංශෝධන කරන්න අවස්ථාව තියනවා.ඒ නිසා අධ්‍යනය කරන්න ඒ කාලය ප්‍රමාණවත් කියලා මා සිතනවා.තවත් කාලය දෙන්න අවශ්‍යතාවයක් නෑ.ඒක අවසාන තීරණය.

පෙ.ව 11.05 ට ගරු මන්ත්‍රී උදයසාන්ත මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,මං දැනගන්න කැමතියි අයවැය කෙටුම්පත පිළිබඳ දැනගන්න අවශ්‍ය මුදල් කමිටුවේ මන්ත්‍රීවරු විතරද කියලා.ඒ වගේමයි සභාපතිතුමා නැති අවස්ථාවේ බලය තියෙන්නෙ උපසභාපතිතුමාට.මං මේ සභාවේ උපසභාපතිවරයෙක් විදියට අවුරුදු 10ක් ඉදලා තියනවා.ඒ කාලය තුළ අපිටම වෙන්වුණු බොහෝ දේවල් තිබුණා මං බලාපොරොත්තු වුනා මේ අයවැයෙන් උපසභාපතිතුමාට වෙන්වුණු වෙනම තැනක්වත් හදලා දෙයි කියලා.වැඩයෝජනා 33ක් තියන මේ අයවැයේ අකුරුගොඩට,හොරගොඩට වැඩයෝජනා නෑ. මං තමයි මුලින්ම වැඩයොජනා ගෙනත් භාර දුන්නේ.මං දුන්නෙ ආදායම් උත්පාදනය කරන්න පුළුවන් වැඩ යෝජනා.මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය,අකුරුගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය,පශු වෛද්‍ය කාර්යාලය,හදන්න සල්ලි තියනවා. ලබන අවුරුද්ද සඳහා කාර්ය මණ්ඩලයටත් මන්ත්‍රී දීමනා ගෙවීමටත් 40%ක් පමණ වැඩි කරගන්න ඕන.යම් යම් සාධනීය යෝජනා ගෙනාවා.අපි ඒ වෙනුවෙන් උපරිම සහයෝගය ලබා දුන්නා.කළින් අවුරුද්දෙ මිල ගණන් වලට තව කීයක් හරි වැඩි කරලා පෙන්නුවට අයවැයක් වෙන්නෙ නෑ.මේ අයවැය කතාව නෙවෙයි කල් ඉල්ලන කතාව.සෞඛ්‍ය

ගැන කතා කරොත් කැලි කසල,රෝග නිවාරණ හැමදාම කරපු දේවල් තමයි තියෙන්නෙ.ආදාහනාගාර කටයුතු සිදු කිරීම කියන්නෙ මොකද්ද කියලා දැනගන්න කැමතියි.පහුගිය කාලේ මාලිම්බඩ සභාවේ සල්ලි වලින් කිසිදු පාරක් හැදුවෙ නෑ.අපි ඒ සල්ලි එකතු කලේ මේ පුරවරේ මිනිස්සුන්ට ආදාහනාගාරයක් හදලා දෙන්න ඕන නිසාමයි.සල්ලි කීයක් හරි ඉතුරු වෙලා තියනවා නම් ලේකම් මිස්ට ස්තූතිවන්ත වෙන්න ඕන.නැවත වතාවක් අයවැය සඳහා වෙනම දවසක් ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් නිහඬවනවා ස්තූතියි.

පෙ.ව 11.08 ට ගරු මන්ත්‍රී උදයසාන්ත මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

අයවැය කතා කරනවා.ඒක තමා අවසන් තීරණය.අද දවස මදි වුනොත් වෙනත් දවසක් දෙන්නම්.අද කතා කරන්න පුළුවන් උපරිම අද කතා කරමු.බෙදීමක් අවශ්‍යයි නම් ඒ වෙනුවෙනුත් අවස්ථාව තියනවා.

පෙ.ව 11.30ට ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට (පෙ.ව 11.30)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

පෙ.ව 11.32ට ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

පෙ.ව 11.40ට ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

පෙ.ව 11.43ට ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

පෙ.ව 11.44ට ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

පෙ.ව 11.46ට ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

අයවැය යොජනාවට අදාළ පැහැදිලි වියයුතු කරුණු විෂය නිලධාරීන් ගෙන්වා කාරක සභාවේදී සාකච්ජා කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීමට (පෙ.ව 11.55)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී උදයසාන්ත මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා

**<u>ගරු මන්ත්‍රී උදයසාන්ත මහතා</u>**

ගරු සභාපතිතුමනි,හොරගොඩ කොට්ඨාශය වෙනුවෙන් තරඟ කරලා ඔවුන්ගේ බලාපොරොත්තු එක්ක මං මේ සභාවට මන්ත්‍රීවරයෙක් විදියට තේරී පත් වුනේ.එහිදී 2026 අයවැය යෝජනාවලියට මං යම් යම් කාරණා ලබා දුන්නත් ඒවා සඳහන් නොවීම පිළිබඳ මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා.හැබැයි සභාපතිතුමාගේ ප්‍රකාශයකින් කියවුණා අයවැයේ නොතිබුණා කියලා කරන්න බැරි කමක් නෑ කියලා.ඒ ප්‍රකාශය යතාර්ථයක් බවට පත්වනවා නම් අපි බලාපොරොත්තු වන්නේත් ඒ කාරණාව.ජන්දයට මං ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යටතේ තරඟ කරත් ඒ අවස්ථාවේ පක්ෂයක් විදියට බලය ලබා ගන්න පුළුවන් මට්ටමක නොතිබුණු නිසා ජනතාවට කිව්වේ බලයට පත්වන ඕනෑම පක්ෂයකට සහයෝගය ලබා දීලා හොරගොඩ අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කරනවා කියලා.වත්මන් පාලක පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් සභාවේ නොමැති නිසා මං විශ්වාස කරනවා හොරගොඩ වෙනුවෙන් මගේ සහයෝගය සභාවේ කටයුතු වලට අවශ්‍යයි කියලා.යම් කණගාටුවක් තියනවා සභාපතිතුමනි මගේ කොට්ඨාශයේ රජයේ ප්‍රතිපාදන මත යම් කාරණා සිද්ධ වෙනකොට උදාහරණ විදියට නිවාස දෙකක් සඳහා මුල් ගල් තියලා ඔබතුමා මූලික වෙලා විවෘත කිරීම් සිදු වුණා අපි ජායාරූප දැක්කා.එහිදී අපිට කිසිදු දැනුවත් කිරීමක් හෝ ආරාධනාවක් ලැබුණෙ නෑ.කොහොම වුණත් පහුගිය දින කීපයේ මං වෙනුවෙන් ජන්දය දීපු ජනතාවගේ අදහස් වලට මං සවන් දුන්නා.ඔවුන්ගේ ඉල්ලීම වුනේ අයවැයට විරුද්ධ වෙලා හොරගොඩ හුදකලා කරන්නෙ නැතුව අයවැයට සහය වෙලා අපේ අභිමතාර්ථ ඉෂ්ට කරගමු කියලා.ඒ ජනතා ඉල්ලීමට මං හිස නවනවා.හොඳ දේට හොඳයි කියන්නත් නරක දේට නරකයි කියන්නත් කොන්දක් තියෙන්න ඕන.අයවැය යෝජනාව ගත්තම එකඟ විය හැකි කාරණා වගේම එකඟ විය නොහැකි කාරණාත් තියනවා.හොරගොඩ සභාව සතු ඉඩම් තියනවා සමහර ඒවා ඇතුළත්වෙලා නෑ.ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.මං ඉදිරිපත් කරපු යෝජනාවක් තමයි තෙලිජ්ජවිල පුස්තකාලයට විමර්ශන ඒකකයක් ස්ථාපිත කරන්න කියලා.ඒ යෝජනාව අයවැයට ඇතුළත් වෙලා තියනවා.ඒ ගැන ස්තූතිවන්ත වනවා වගේම මේ අයවැය යෝජනාවට මගේ සහයෝගය ලබා දෙන බව ප්‍රකාශ කරමින් නිහඬවනවා ස්තූතියි.

පෙ.ව 11.59ට ගරු මන්ත්‍රි ගරු මන්ත්‍රි පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මිය තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

පෙ.ව 12.01ට ගරු මන්ත්‍රි ගරු මන්ත්‍රි පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මිය නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා</u>**

ගරු සභාලතිතුමනී,මේ මංගල අයවැය යෝජනාව බැලුවම කොට්ඨාශ 10 තුළම ලොකු වැඩපිළිවෙලක් තියනවා.සභාපතිතුමාගේ ප්‍රකාශය තුළ කළ යුතු වැඩ අයවැය තුළ තිබුණත් නැතත් කරනවා කියන කාරණාව අපි අගේ කරනවා.මගේ කොට්ඨාශයේ වසම් 3ක් තියනවා.ජනතාව යෝජනා ගෙනත් දෙනවා කරයි කරයි කිව්වට අඩුපාඩු හුඟක් තියනවා.ඒ වගේ හැම යෝජනාවක්ම දාන්න ගියොත් මේ යෝජනාවලිය මහා පුස්තකයක් බවට පත්වනවා.අයවැය යොජනාවලිය විධිමත් විදියට සකස් කරලා තියනවා.නවක මන්ත්‍රීවරු විදියට දැනගත යුතු කරුණු රාශියක් මේ අයවැය හරහා අපි දැනුවත් වුණා.එක්ව ගමනක් යන්න අයවැය යෝජනාවට සහයෝගය ලබා දෙන්න කියලා මං ඉල්ලා සිටිනවා.ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,අකුරුගොඩ කොට්ඨාශෙ වැඩ යෝජනාවක් අයවැය යෝජනාවට ඇතුළත් වුනේ නැති වුණත් මං කණගාටු වෙන්නෙ නෑ මොකද කළ යුතු වැඩ ටික අනිවාර්යෙන්ම කරන්න පුළුවන් කියලා ඔබතුමා කිව්වා.ඒ ගැන අපිට විශ්වාසයි.මං ගිය සතියෙ ගියා උස්ගොඩ බටහිර සෞඛ්‍ය මධ්‍යස්ථානයට.පවුල් සැලසුම් නිලධාරීතුමිය යෝජනා ටිකක් දුන්නා.ඇත්තටම වෙන්න ඕන කොට්ඨාශේ අඩුපාඩු හඳුනා ගෙන අයවැය තුළ නොතිබුණත් පලාත් සභා අරමුදල් වලින් හරි ඒ කටයුතු කරගන්න පුළුවන්.ඒ නිසා සියලු දෙනාගේ සහය ලබා දෙන්න කියන ඉල්ලීම කරමින් නිහඩවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා</u>**

පොහොසත් රටක් ලස්සන ජීවිතයක් අපේ තේමා පාඨය කරගෙන මේ ඉදිරිපත් කරලා තියන අයවැය මාලිම්බඩ සහා ඉතිහාසයේ සුවිශේෂීම අයවැය කියල මා හිතනවා.මා නියෝජනය කරන කද්දුව කොට්ඨාශය තුළ සංවර්ධනය නොවූ තැන් රාශියක් තියනවා.ඒ නිසාම මේ යෝජනාවලියේ කද්දුව කොට්ඨාශේ සුවිශේෂී ව්‍යාපෘති කිහිපයක්ම එකතු කරලා තියනවා ඒ ගැන ස්තූතිවන්ත වනවා.මේ අයවැය සඳහා සියලු දෙනාගේ සහය ලබා දෙන මෙන් ඉල්ලා සිටිමින් නිහඩවනවා ස්තූතියි.

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,මං මේ සභාවට ආපු දවසෙ ඉඳන් හිතපු දෙයක් තමයි හොඳ ගමනක් යන්න හොඳ ටීම් එකක් ඉන්නවා කියලා.අපි හැමෝම සාකච්ඡා කරලා සහෝදරත්වයෙන් මේ ගමන යමු කියන එක තමයි මගේ අදහස.විශේෂයෙන් මං කතා කරන්න අදහස් කරේ හිටපු ගරු උපසභාපතිතුමා අදහසක් ඉදිරිපත් කරා උපසභාපති තනතුර ගැන සඳහන් කරලා වෙනම කාමරයක අවශ්‍යතාවය පිළිබඳව.ජනතාව මේ ලබා දීපු වරම තනතුරක් විතරයි.ඉන් එහාට අවශ්‍යතාවයක් නෑ.මං පෞද්ගලිකවත් ඒ කිසි දෙයක් බලාපොරොත්තු නෑ.මෙතනට ඇවිල්ලා ජනතාව වෙනුවෙන් වැඩක් කරන්න තියනවා නම් ඒක තමයි විය යුතු දේ.මන්ත්‍රීතුමාගේ අදහසට බොහොම ස්තූතිවන්ත වනවා.මං විතරක් නෙවෙයි අපි කවුරුත් එහෙම තමයි විශේෂ දෙයක් බලාපොරොත්තු වෙන්නෙ නෑ.කණ්ඩායමක් විදියට වැඩ කරද්දි නොයෙක් ප්‍රශ්න ගැටළු එන්න පුළුවන්.දෙපැත්තට බෙදිලා ජන්දයට ඉදිරිපත් වුණාට අපි කවුරුත් ජනතාව වෙනුවෙන් වැඩ කරන්න ආවේ.ඒ නිසා මං සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා මේ අයවැය යෝජනාවට සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන්න කියලා.ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,2026 අයවැය කියන්නේ සභාවට ඉතාම සුවිශේෂී දෙයක්.අයවැයට එන්න කලින් රටේ මේ වෙද්දි සුභවාදී වැඩපිළිවෙලක් තියනවා බිමේ පය ගහලා ඉන්න අන්ධ වෙලා නැති ඕනෑම කෙනෙක්ට ඒක තේරුම් ගන්න පුළුවන්.නමුත් ප්‍රතිගාමී බලවේග නිතර බලනවා මිනිසුන්ගෙ ඔළු මොනවගෙන් හරි පුරවලා මේක වෙනස් කරන්න.ඒ රටේ පොදු තත්ත්වය.මේ සභාවටත් ඒ තත්ත්වය ඒ ආකාරයෙන්ම අනුරූපිතයි.බාධක හැල හැප්පීම් එන්න පුළුවන්.මිනිසුන් මේ අලුත් දේශපාලන සංස්කෘතිය පිළිබඳ ලොකු විශ්වාසයක් තියලා තියනවා.යම් යම් අඩුපාඩු දැක්කට මේ 2026 අයවැය සාර්ථක කරගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම මේ අපේ මන්ත්‍රී කණ්ඩායම සතුව පවතිනවා.ඒ තමයි හොරකම,වංචාව,දූෂණය,නාස්තිය සභාවක් විදියට අතුගාලා දාලා ඉවරයි.මං හිතන්නේ ඒක අපිට සතුටක් වගේම ආඩම්බරයක්.මීටත් එහා වැඩ කොටසක් ගරු සභාපතිතුමා කිව්ව වගේ කරන්න පුළුවන්.අවශ්‍ය සියලු දෙනාගේ

කැපවීම මහන්සිය හා අධිෂ්ඨානය පමණයි.3% ඉඳලා මෙච්චර හරියක් කරපු එකේ මැදින් දාලා යයිද.මේ ගේමත් කොහොම හරි ගහනවා.ඒකට විපක්ෂෙ ඉන්න කණ්ඩායමෙන් අපිට ලොකු සහයෝගයක් ලැබෙනවා.අපිට පෞද්ගලික අමනාපකම් නෑ.කුමන දේශපාලන මතය දැරුවත් පොදු වැඩ වලදි එකඟවන පිරිසක් ඉන්නේ.මේ කෙටි කාලය තුළ අපි සතුටු ගමනක් ආවා.2026 මේ මහන්සි වුනා වගේ දෙතුන් ගුණයක් මහන්සි වෙමු.අපි මේ අයවැය සතුටු ගමනක් කරගමු.මේ අයවැයේ සුවිශේෂී කාරණාවක් තියනවා.ආදායම සුවිශේෂී මට්ටමකට වැඩිවෙලා තියනවා.වරිපනම් තක්සේරුවත් එක්ක.සභාව හොඳ තැනකට ගේන්න සභාවේ සභාපතිවරයෙකු මන්ත්‍රීවරයෙකු වීමේ ගෞරවනීය තත්වයකට පත් කරන්නට අපි සියලු දෙනාට හැකියාව තියනවා.මේ වැඩ කොටස කරන්න අපේ උපරිම සහයෝගය සභාපතිතුමාට උපසභාපතිතුමාට ලබා දෙමු.එක අරමුණකින් වැඩ කරමු කියන ඉල්ලීම කරමින් නිහඬවනවා ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු සභාපතිතුමනි,ගරු මන්ත්‍රීවරුන්ගේ කතාවත් එක්ක කණගාටුව ප්‍රකාශ කරනවා.ඒ තමයි ගරු සභාපතිතුමා කියන්නේ මේ අයවැයට සම්පූර්ණ වගකිවයුතු කෙනා.සභාපතිතුමාට පරිභාහිරව දේවල් කරනවා නම් ඒක වෙනම කරන්න පුළුවන්.හැබැයි එතුමට එහෙම ප්‍රකාශයක් කරන්න බෑ.ඇතුළත් කළ යුතු යෝජනා ඇතුළත් කරලා තියෙන්නේ එතුමා.ඒ නිසා එතුමාට අවශ්‍ය උපදෙස් දෙන එක ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ වගකීම.ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන්ගේ සහයෝගය දෙන එක ඔබෙත් මගේත් වගකීම යුතුකම.ඒ නිසා අයවැය වාර්තාව තමයි සභාවේ ඉතාම වැදගත් වාර්තාව.මේකේ ඇති දේවල් තමයි අපි කළයුතු වන්නේ.නැති දේවල් කරන්න කියලා කොහේදිවත් කියලා දීලා නෑ.මේ අපේ බල ප්‍රදේශයේ ජනතාවට බලපාන අයවැය. හර්ෂණී මන්ත්‍රීතුමිය පොඩි කාලයක් ඉල්ලුවත් වැරැද්දක් වුණා අපේ පැත්තෙන් දවස් හතරකට කළින් ලිඛිතව ඉල්ලීමක් කරපු නැති නිසා.ඒ ගැන කණගාටු වෙනවා.

මහා සභාව කාරක සභාවක් බවට පත් කිරීමට (ප.ව 12.55)

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය

ප.ව 1.30ට ගරු මන්ත්‍රී දිල්කි හන්සිකා මෙනවිය තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

ප.ව 1.33ට ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී දිල්කි හන්සිකා මෙනවිය නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

ප.ව 1.35ට ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

ප.ව 1.40ට ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

අයවැය වාර්තාවේ ආදායම් වියදම් පිළිබඳ ආදායම් පරීක්ෂක හා විෂය නිලධාරීන් ගෙන්වා පැහැදිලි කිරීම් සිදු කරන ලදී.

කාරක සභාව මහා සභාවක් බවට පත් කිරීමට (ප.ව 1.45)

යෝජනා කළේ :- ඒ.එච්.පී.චරිත් උදාර මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු සභාපතිතුමනි,විශේෂයෙන්ම මේ අයවැය සකස් කරපු සභාපතිතුමාටත් ඒ වගේම ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් බෙහෙවින් ස්තූතිවන්තවනවා.ඔබ සියලු දෙනා හරියාකාරව මෙය සිදු කරයි කියන විශ්වාසයකින් යුතුවයි මෙය සාකච්ජා කළේ.මෙහි එකඟ විය නොහැකි තැන් කීපයක් තියනවා.ඒ වගේම ඉල්ලීමක් කරනවා 2027 අයවැය ඉදිරිපත් කිරීමේදී සියලුම දෙනාට කෙටුම්පතක් ලබා දෙන්න සහ නිවැරදි විය යුතු තැන් නිවැරදි කරලා ඉදිරිපත් කරන්න කියලා.

**<u>ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා</u>**
ගරු මන්ත්‍රීතුමනි,අයවැය ලේඛණය පිළිබඳ සාකච්ජාවේදී විවිධ කරුණු කාරණා මතු වුනා.සියලු දෙනාගේ බලාපොරොත්තුව මාලිමුබඩ ජනතාවගේ අභිවෘද්ධිය.අයවැය ලේඛන තුළ තිබුණත් නොවුනත් කළ යුතු දේ ඉෂ්ට සිද්ධ කරලා ජනතා සුභ සිද්ධිය 2026 වර්ෂයේදී උපරිම ආකාරයෙන් අපේ කාර්ය භාරය ඩටු කරමු කියලා ප්‍රකාශ කරනවා.ස්තූතියි.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජී හර්ෂණී ගුණසේකර මිය</u>**
ගරු සභාපතිතුමනි,2026 අයවැය මං පෙර ඉල්ලූ පරිදිම නැවත ඉල්ලනවා පුළුවන්නම් තව දවසකට කල් දෙන්න මේ අයවැය ගැන කතා කරලා මීට වැඩිය හොඳ තැනකට එන්න ඕන.මං දැකපු පහුගිය අයවැය 05ම වගේ තමයි කිසිදු සුවිශේෂිතාවයක් මං දැක්කෙ නෑ.නැති දේවල් කරන්න නම් අයවැයක් අවශ්‍ය නෑ.මං බලාපොරොත්තු වුනා ඔබතුමාලාගේ තේමා පාඨය යටතේ සතුටු මාලිම්බඩක්.අයවැයක් තුළ සියලු දෙනා නියෝජනය වෙන්න ඕන.මා නියෝජනය කරන හොරගොඩ ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව ඉන්නවා ඒ වගේම කාන්තා කෝඨාව නිසයි මං මේ සභාවේ අද වාඩි වෙලා ඉන්නේ.ඒ ප්‍රජාව වෙනුවෙන් මොනවද තියන වැඩ කටයුතු.සෞඛ්‍ය වැඩසටහන්,පෙර පාසල් ආදිය හැමදාම සිදු කරන දේවල්.ඒ වගේම ආබාධිත ජනතාව අමතක කරලා තියනවා.2027 දි සියලු දෙනාම කතා කරලා එක තැනකට ඇවිල්ලා කෙටුම්පතක් සාකච්ජා කරලා ඊටපසු අයවැය සාකච්ජා කරමු.මේ යෝජනා 33 ඇතුළෙ මගේ හොරගොඩ නොමැති වීම පිළිබඳ කණගාටුව මං ප්‍රකාශ කරනවා.තව හුඟක් කතා කළ යුතු තැන් තියනවා මගේ අයිතිවාසිකමක් ලෙස මං මේ අයවැය යෝජනාවට විපක්ෂයි.මං බෙදීමක් ඉල්ලනවා.ස්තූතියි.

ප.ව 2.00ට ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා තාවකාලිකව සභාවෙන් පිටව යන ලදී.

ප.ව 2.03ට ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා නැවත සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**

ගරු මන්ත්‍රීතුමනි,ඔබතුමාගාගේ අදහස් දැක්වීම් වලදි කියවුනු කාරණා සම්බන්ධව පැහැදිලි කළ යුතු තැන් කිහිපයක් තියනවා.ඇල්ගිරිය කොට්ඨාශෙ මන්ත්‍රීතුමා අදහසක් ප්‍රකාශ කලා එතුමගේ සමහර යෝජනා තිබ්බෙ නෑ කියලා.ඇත්තටම ඒ යෝජනා අපි පළාත් සභාව යටතේ සිදු කරන ඉල්ලීම් වලට යොමු කරලා තියනවා.ඊට අමතරව ඇල්ගිරිය යෝජනා දෙකක් අයවැයට දාලා තියනවා.උදය සාන්ත මන්ත්‍රීතුමගේ අදහසක් තිබුණා නිවාස යෝජනා වලදි සම්බන්ධ කරගත්තෙ නෑ කියලා.ඒ නිවාස ව්‍යාපෘති ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කළේ.ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තමයි අපිට ආරාධනාව ලැබුණේ.අපි සංවිධානය කර සියලු දේවල් වලට මන්ත්‍රීවරුන්ට ආරාධනා යවලා තියෙනවා.සමහර අය ඒ දේවල් වලට සහභාගී වුණා.ඊට පස්සෙ අදහසක් ආවා හැම අයවැයකටම මං මේ සභාවේ විරුද්ධ වුනා කියන කාරණාව.පොදු දේවල් වලට සහය නොදුන්නා වගේ අදහසක් ඒ කතාවෙන් පැහැදිලි වුනා.ඒ හිටපු කාල සීමාවේ පොදු හොඳ වැඩ වලට සහය දුන්නා කිසිදු බාදාවක් කළේ නෑ.හැබැයි ඒ අයවැය වලදි එකඟ විය නොහැකි කාරණා වලට පුද්ගලයෙක් විදියටත් පක්ෂයක් විදියටත් තීන්දු තීරණ ගත්තා.තවත් අදහසක් ආවා ආදාහනාගාරයට ඉතුරු කරපු සල්ලි වලින් තමයි පහුගිය කාලේ වැඩ කළේ කියලා.ඒක වැරදියි.ආදාහනාගාරයකට එහෙම ඉතුරු කරපු මුදල්වත් කොහෙන්හරි ගෙනාපු මුදල්වත් සභාවේ නෑ.ආදාහනාගාරය හදන්න වෙන් වුනු රුපියල් ලක්ෂ 10ක මුදලක් තියනවා.ඒක තාම තියනවා.අක්‍රමිකතාවයක් හේතුවෙන් යම් පරීක්ෂණයක් තියනවා.ඒ මුදල් වියදම් කරන්න බෑ පරීක්ෂණ අවසන් වෙලා තීන්දුව ලැබුණම තමා ඒක වියදම් කරන්න වෙන්නෙ.පහුගිය කාලේ සංචිත මුදලක් තියනවා නම් ඒ ජනතාවගෙ මුදල්.කෝටි 2ක 3ක සංචිත මුදලක් තිබුණෙ නෑ.අනිත් කාරණාව ආදාහනාගාර කටයුතු සම්බන්ධව අපි අයවැයේ සඳහන් කරලා තියනවා.මාලිම්බඩ ආදාහනාගාරයක් හදන්න ස්ථානයක ප්‍රශ්නයකුත් තියනවා අවශ්‍යතාවය තිබුණත් කිසිම කෙනෙක් තමන්ගේ ප්‍රදේශයේ ආදාහනාගාරය හදනවට කැමති නෑ.දිගටම ඇවිල්ලා තියෙන්නෙ විරුද්ධ මතයක්.අනිත් එක අපි පලාත් පාලන ආයතනයක් විදියට යම් කටයුත්තක් කරනවා නම් විදයම් කරනවා වගේම ආදයම පෙන්නන්න ඕන.මාලිම්බඩ සභාවට ඒ වියදම පෙන්නන්න යද්දි කොමසාරිස්තුමා අනුමත කරේ නෑ ආදාහනාගාරයක් පහුගිය කාලේ.ඒකට හේතුව ආදාහනාගාරයකට ගියොත් ඒ මුදල අපිට ගෙවා ගන්න බැරි වෙනවා කියන කාරණය නිසා.ආදාහනාගාරයක අවශ්‍යතාවය මාලිම්බඩ සභාවට අඩුවෙන් තියනවා කියන එක තමයි නිගමනය තියෙන්නේ.ආදාහනාගාරය නම් කරලා නෑ.නමුත් අපි ඒ කටයුතු ගැන හිතලා තියනවා.අවමංගල්‍ය ශාලාවක් මාලිම්බඩට ගේන්න,මාලිම්බඩ සුසාන භූමි ටික සංවර්ධනය කරන්න වගේ දේවල් එක්ක තමයි ඒ යෝජනා ටික දාලා තියෙන්නේ.හර්ෂණී මන්ත්‍රීතුමියගෙන් අදහසක් ආවා කාන්තාවන්ට හා ආබාධිත පුද්ගලයින්ට අවස්ථාවක් දීලා නෑ කියලා.මං හිතන්නෙ ඒ ප්‍රජාවන් දෙකටම අපේ රජය තමයි වැඩිම අවස්ථාවක් දීලා තියෙන්නේ.ආබාධිත පුද්ගලයින් හදුනාගෙන ඔවුන්ගේ ජීවිතය නගා සිටුවන්න විශාල වැඩ පිළිවෙලක් තියනවා.ඊට සාපේක්ෂව අපේ පැත්තෙන් දාපු යෝජනා මේ අයවැයේ තියනවා.පසුගිය මාස කිහිපය තුළ එවැනි වැඩසටහන් රාශියක් කරා.2025 වෙන් කරපු මුදල් ප්‍රමාණයක් තව ඉතුරු වෙලා තියනවා ආබාධිත,කාන්තා හා වැඩිහිටි අය වෙනුවෙන්.ඒ සඳහා ඉදිරියේදී අවස්ථාව ලබා දෙනවා.අපෙත් පළවෙනි අයවැය ඒ නිසා අඩුපාඩු තියෙන්න පුළුවන්.අපි විශ්වාස කරනවා මෙතෙක් ඉදිරිපත් කරපු අයවැය එක්ක වෙනස් අයවැයක් අපි ඉදිරිපත් කරලා තියනවා කියලා.ඒ නිසා මේ ඉදිරිපත් කරන සංශෝධන වලට යටත්ව අයවැය සභා සම්මත කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා විසින් ඉදිරිපත් කළ සංශෝධිත යෝජනාව</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය පහත සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

2026 අයවැය ලේඛනයෙහි වැඩසටහන් අංක 01 හි වියදම් සංකේතය 103 සැපයුම් හා උපකරණ වැය ශීර්ෂයේ 2025 වර්ෂයේ ඇස්තමේන්තුවේ එකතුවෙහි සිදුව තිබූ සටහන් කිරීමේ දෝශය ,වැඩසටහන් අංක 03 ආදායම් සංකේතය 25 කුලියට දීම අය ශීර්ෂය යටතේ 2026 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුවේ අඩුවෙන් සටහන් වීමේ දෝශය ,ආදායම් සංකේතය 60 යටතේ වෙනත් ආදායම් ශීර්ෂයේ 2025 වර්ෂයේ ඇස්තමේන්තුව වැඩියෙන් සටහන් වීමේ දෝශය ,වැඩසටහන් අංක 06 වියදම් සංකේතය 605 ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා වැය ශීර්ෂය යටතේ ජල බිල්පත් ඇස්තමේන්තු ගාස්තු 2025,2026 වර්ෂ 2 දීම දෙවරක් සටහන් වීමේ දෝශය හා ඒ නිසා සිදුවූ එම ශීර්ෂයෙම එකතුව වෙනස්වීමේ දෝශය හා එම වැඩසටහනේම 607 වැය සංකේතය යටතේ සාහිත්‍ය හා සංස්කෘතික උත්සව වැය ශීර්ෂය යටතේ වැය අඩුවෙන් සටහන් වීමේ දෝශය හා එම නිසා එම වැය ශීර්ෂයේ මුළු එකතුව අඩුවෙන් සටහන් වීම දෝශය,වැඩසටහන් අංක 05 යටතේ 2025 වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්ථන ආදායම එකතුව හා ඇස්තමේන්තුගත පුනරාවර්ථන වියදම එකතුව සටහන් වීමේ දෝශය පහත පරිදි සංශෝධනය විය යුතුය.

වියදම් ශීර්ෂය 103 සැපයුම් හා උපකරණ රු:5,450,000 ලෙසත්, අදායම් සංකේතය 25 කුලියට දීම රු:115,200 ලෙසත්, ආදායම් සංකේතය 60 වෙනත් ආදායම් රු:500,000 ලෙසත්, වැඩසටහන් අංක 06 වැය ශීර්ෂය 605 ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා වල 2025 වර්ෂයේ මුළු එකතුව රු:677,100 ලෙසත් 2026 වර්ෂයේ ප්‍රවාහන සම්බන්ධතා හා වෙනත් සේවා වල එකතුව රු:1,575,100 ලෙසත් 607 වැය ශීර්ෂය යටතේ සාහිත්‍ය හා සංස්කෘතික උත්සව කටයුතු ශීර්ෂය රු:800,000 ලෙසත් එම වැය ශීර්ෂයේ මුළු එකතුව රු:8,075,200 ලෙස හා වැඩ සටහන් අංක 05 යටතේ 2025 වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්ථන ආදායම රු:5,157,960 ලෙසත් 2025 වර්ෂයේ ඇස්තමේන්තුගත පුනරාවර්ථන වියදම රු:4,031,260 ලෙසත් සංශෝධන විය යුතුය.

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත සහිත අයවැය යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එච්.පී.චරිත් උදාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා</u>**
හර්ෂණී මන්ත්‍රීතුමිය විසින් බෙදීමක් ඉල්ලා සිටියා අපි ඊට එකගවනවා.2026 සංශෝධිත අයවැය යෝජනාව සඳහා ජන්ද විමසීමේ කටයුතු සිදු කිරීමට ලේකම්තුමියට භාර දෙනවා.

| අනු අංකය | සභිකයාගේ නම | පක්ෂයි | විපක්ෂයි | ඡන්දය දීමෙන් වැළකී සිටී | නොපැමිණි |
|---|---|---|---|---|---|
| 1 | ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා | ✓ | | | |
| 2 | ගරු උපසභාපති කෝදාගොඩ ගමගේ සමන් කුමාර මහතා | ✓ | | | |
| 3 | ගරු මන්ත්‍රී පී.ජී.පාලිත කුමාර මහතා | | ✓ | | |
| 4 | ගරු මන්ත්‍රී ජී.පී.උදය සාන්ත මහතා | ✓ | | | |
| 5 | ගරු මන්ත්‍රී ආර්.ජී.හර්ෂණී ගුණසේකර මිය | | ✓ | | |
| 6 | ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මූණසිංහ මහතා | ✓ | | | |
| 7 | ගරු මන්ත්‍රී ජ්.එච්.පී.චරිත් උදාර මහතා | ✓ | | | |
| 8 | ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා | ✓ | | | |
| 9 | ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා | ✓ | | | |
| 10 | ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා | ✓ | | | |
| 11 | ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා | ✓ | | | |
| 12 | ගරු මන්ත්‍රී ආර්.ජේ.ලයනල් මහතා | ✓ | | | |
| 13 | ගරු මන්ත්‍රී හෂිත සුබෝදන මාරතුඩුවගේ මහතා | | | | ✓ |
| 14 | ගරු මන්ත්‍රී පී.ජී.බසින්ද්‍යා පුෂ්පමාලි මෙය | | ✓ | | |
| 15 | ගරු මන්ත්‍රී සමල්ෂා උෂාදි විජේවික්‍රම මෙය | | ✓ | | |
| 16 | ගරු මන්ත්‍රී දිල්කා හන්සිකා අබේසුන්දර මෙය | | ✓ | | |
| 17 | ගරු මන්ත්‍රී ජේ.එල්.සුමිත් මහතා | | ✓ | | |
| 18 | ගරු මන්ත්‍රී නිහාල් අබේවික්‍රමසිංහ මහතා | | ✓ | | |
| 19 | | | | | |
| | එකතුව | 10 | 07 | | 01 |

ඒ අනුව පැමිණ සිටි මන්ත්‍රී සංඛ්‍යාවෙන් ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරු 10ක් අයවැය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර විපක්ෂව මන්ත්‍රීවරු 07ක් ඡන්දය ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 සංශෝධිත අයවැය පැමිණ සිටි සභිකයන්ගෙන් වැඩි ඡන්ද 03කින් සභා සම්මත විය.

දිවා ආහාරය සඳහා ප.ව 2.20ට සභාව කල් තබන ලදී.

දිවා ආහාරයෙන් පසු ප.ව 2.45ට නැවත සභාව ආරම්භ කරන ලදී.

**යෝජනා අංක 5:17**

2025.08.11වන දින පැවති තෙලිජ්ජවිල පුස්තකාලයේ උපදේශන කමිටුව මඟින් යෝජනා කල පරිදි බල ප්‍රදේශයෙන් පිටත පුස්තකාලය භාවිතයට කැමති පුද්ගලයන් හට නැවත ගෙවීමේ පදනම මත රු.1500.00ක ඇප තැම්පතුවක් මත සාමාජිකත්වය ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව 2025.08.11වන දින පැවති තෙලිජ්ජවිල පුස්තකාලයේ උපදේශන කමිටුව මඟින් යෝජනා කල පරිදි බල ප්‍රදේශයෙන් පිටත පුස්තකාලය භාවිතයට කැමති පුද්ගලයන් හට නැවත ගෙවීමේ පදනම මත රු.1500.00ක ඇප තැම්පතුවක් මත සාමාජිකත්වය ලබා දීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:18</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:19</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:20</u>**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:21</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:22</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද කසල කළමනාකරණ සැලැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2026 වර්ෂය සඳහා සකස් කරන ලද කසල කළමනාකරණ සැලැස්ම අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:23</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු සුල්තානාගොඩ දකුණ ග්‍රාම නිලධාරී වසමේ කහටගහහේන ඉඩමේ ඉදි කර ඇති සේවා පියසක සඳහා පර්චස් 10ක බිම් ප්‍රමාණයක් මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවරා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරුසභාපතිතුමනි,තෙලිජ්ජවිල,අකුරුගොඩනැගෙනහිර,කඩුකන්න,කැකුණවෙල,ගල්ප මුණ ආදී තැන් වල මේ වගේ සේවා පියසවල් තියනවා.හෙට අනිද්දා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නඩත්තු කරගෙන යන්නම් භූමිය අයිතිය දෙන්න කිව්වම අපිට කිසිදු අයිතියක් නැතුව යනවා.සුදුසු ක්‍රියාමාර්ගය ලෙස මම දකින්නේ භූමියේ අයිතිය ලබා නොදී බදු පදනම මත ලබා දීම.ප්‍රජා ශාලාවේ ඉන්නෙ නිලධාරීන්නේ තවදුරටත් සාකච්ඡා කරලා අලි එකඟතාවයකට එන්නම්.සුල්තානාගොඩ තියන පී.ඒ.පෙරේරා අනුස්මරණ සෞඛ්‍ය මධ්‍යස්ථානය ඔය ක්‍රමවේදයට අපි දීලා තියෙන්නේ.උනින්දුවෙලත් සෞඛ්‍ය මධ්‍යස්ථානයත් ඒ විදියට අයිතිය අපිට තියෙන්නෙ.

**<u>ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා</u>**

ගරුසභාපතිතුමනි,හොරගොඩත් මේ තත්වයේ තියෙන්නෙ.කමිටුවක් හරි පත් කරලා මේ ඉඩම් වල අයිතිය තහවුරු කරගැනීමේ වැඩ පිළිවෙලක් සකස් කරන්න.

**ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා**
මේ යෝජනාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා කොමසාරිස් වෙත යොමු කරමු.කැකුණුවෙල සේවා පියසේ අයිතිය අපිට නෑ සියලු නඩත්තු කටයුතු සිදු වන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා.

ඉහත යෝජනාව සඳහා තීරණයක් ගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ උපදෙස් ලබා ගැනීමෙන් අනතුරුව මහා සභාවට යොමු කිරීමට තීරණය විය..

**යෝජනා අංක 5:24**
මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ලේ උඩු මහළ මාතර හා හම්බන්තොට දිසා අපරාධ කොට්ඨාශ කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා රු.70,000.00ක මාසික බදු පදනම මත ලබා දීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු සභාපති ආර්.කේ.නිලන්ත ධම්මජිත් මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී යූ.ජී.දිමේන්ත්‍ර රංගනාත් මහතා

ඉහත යෝජනාව සඳහා ගරු සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට අයත් තෙලිජ්ජවිල පුස්තකාල ගොඩනැගිල්ලේ උඩු මහළ මාතර හා හම්බන්තොට දිසා අපරාධ කොට්ඨාශ කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා රු.70,000.00ක මාසික බදු පදනම මත ලබා දීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

ප.ව 3.15ට ගරු සභාවේ මුලසුන ගරු උපසභාපතිතුමා වෙත පවරා ගරු සභාපතිතුමා අත්‍යවශ්‍ය රාජකාරී කටයුත්තක් හේතුවෙන් සභාවෙන් පිටව යන ලදී

**යෝජනා අංක 5:25**
වෙනිඅකුල ප්‍රජා ශාලාවේ බිත්ති හා දොර ජනෙල් තෙමීම වැලැක්වීමට පීලි සවි කිරීම හා ප්‍රජා ශාලා භූමිය වටා කටු කම්බි ගසා ගේට්ටුවක් සවි කිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව වෙනිඅකුල ප්‍රජා ශාලාවේ බිත්ති හා දොර ජනෙල් තෙමීම වැලැක්වීමට පීලි සවි කිරීම හා ප්‍රජා ශාලා භූමිය වටා කටු කම්බි ගසා ගේට්ටුවක් සවි කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 5:26**
ප්‍රාදේශීය සභාවට අයත් ඔිගස්පෙ සුසාන භූමියට මිහිදන් කිරීමට හා ආදාහනය කිරීමට රැගෙන එන මෘත ශරීර ආගමික කටයුතු හා අවමංගල්‍ය උත්සව කටයුතු සිදු කරන තෙක් තාවකාලිකව තැම්පත් කරලීමට දර්ශනීය මෘත සිරුරු ද්‍රාරක නිවහනක්(summer house)ඉදිකිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

ගරු මන්ත්‍රීවරුවනි,පසුගිය දිනක මෘත දේහයක් ආදාහනය සඳහා රැගෙන ආවා වර්ෂාව පවතින දිනයක.මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඇවිල්ලා මිනුම් කටයුතු සිදු කරා සුද්ද කරලා තියනවා.හදිසි අවමංගල්‍ය අවස්ථාවක මං සජීවි අත්දැකීමක් ලැබුවා නිවසක මිය ගිහින් තිබුණු පුද්ගලයෙක් මෘත දේහය සම්පූර්ණ නරක් වෙලා තිබුණා.මිහිදන් කටයුතු කරන්න කලින් ආගමික කටයුතු සිදු කරන්න තැනක් තිබුණෙ නෑ.සභාපතිතුමා සමඟ මේ ගැන කතා කරාම කිව්වේ ඉදිකිරීම් සම්බන්ධව විගණන පරීක්ෂණයක් තියන නිසා ගැටලුවක් තියනවා කියලා.පරීක්ෂණ වලට ගැටලුවක් නොවන විදියට මෘත දේහය තබා ගන්න නිවස්නක් තමා දා අදහස් කලේ.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,මං හිතන්නේ මේක ඉතාම වටිනා යෝජනාවක්.මේ වගේම තමයි අධිකාරීවිලගම සුසාන භූමියත්.වැසි දවසට යන්න ඉතාම අපහසුයි.ඒ වගේම තමයි 1999 වර්ෂයේ ආදාහනාගාරයක් හදන්න එවකට මහ ඇමති මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා ලක්ෂ 10ක මුදලක් ලබා දුන්නා.සභා අනුමැතියකින් තොරව අඩිතාලම දාපු නිසා ඔඩිට් එකෙන් නතර කරපු නිසා ඒ මුදල් සභාපතිතුමා කිව්වා වගේ තාම තියනවා.පාරක් තොටක් හදන්නෙ නැතුව අපි එකතු කරේ වාර්ෂිකව එකතු වන මුදල් කෝටි 4ක් පමණ.දැන් කොහොමත් ආදාහනාගාරෙ හැදෙන්නෙ නැති නිසා ඕගස්පෙ නඩු තීන්දුවෙන් අපි දිනලා තියනවා මේ සුසාන භූමියේ ප්‍රවේශ මාර්ගය හරියට හදලා වැට මායිම් දාන්න කියලා ඉල්ලනවා.ඒ වගේම මං ඉල්ලීමක් කරනවා මේ විදියටම අධිකාරීවිලගම සුසාන භූමියටත් මේ වගේම මෘත දේහය තියන්න නිවස්නක් හදලා දෙන්න කියලා.

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

අධිකාරීවිලගම සුසාන භූමියටත් මේ අවශ්‍යතාවය තියනවා.ඒ නිසා ඉදිරි සභාවකට යෝජනාවක් විදියට එය ඉදිරිපත් කරමු.

**<u>ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,අධිකාරිවිලගම සුසාන භූමිය අපි දැනටමත් ඉදිරිපත් කරලා තියනවා.මැනුම් කටයුතු කිරීමක් අවශ්‍යයි.අවට නිවෙස් වල අයත් ඉල්ලීමක් කරලා තියනවා එයාලගේ ඉඩම් වෙන් කරලා දෙන්න කියලා.ඔප්පුවකින් දීලා නෑ.නිවාස සංවර්ධන අධිකාරියෙන් ඉල්ලීමක් කරලා තමයි ඒ කටයුතු සිදු කරන්න වෙන්නෙ.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව ප්‍රාදේශීය සභාවට අයත් ඕගස්පෙ සුසාන භූමියට මිහිදන් කිරීමට හා ආදාහනය කිරීමට රැගෙන එන මෘත ශරීර ආගමික කටයුතු හා අවමංගල්‍ය උත්සව කටයුතු සිදු කරන තෙක් තාවකාලිකව තැම්පත් කරලීමට දර්ශනීය මෘත සිරුරු ද්‍රාරක නිවහනක්(summer house)ඉදිකිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:27</u>**

මාලිම්බඩ මංසන්ධියේ අකුරැස්ස පාරට හා මාතර පාරට මුහුණලා අව්වට වැස්සට,සුළඟට හා අනතුරු වලින් ආරක්ෂා වීමට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සත්කාරයකි යන්න සඳහන් කර මගී ආවරණයක් ඉදිකිරීමට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව මාලිම්බඩ මංසන්ධියේ අකුරැස්ස පාරට හා මාතර පාරට මුහුණලා අව්වට වැස්සට,සුළඟට හා අනතුරු වලින් ආරක්ෂා වීමට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සත්කාරයකි යන්න සඳහන් කර මගී ආවරණයක් ඉදිකිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,කළින් සභාව ඉස්සරහ බස් නැවැත්තුවෙ නෑ.අපි සම්බන්ධීකරණ කමිටුවෙ කතා කරලා නිලධාරීන් වෙනුවෙන් බස් නතර කරගන්න කතා කරගත්තේ.නැත්තම් බස් හෝල්ට් එක තිබුණෙ මාතර පාරේ සමූපකාරය ළඟ.ඒ නිසා හොඳ යෝජනාවක්.සුදුසු තැනක් තියනවද කියලා බලන්න ඕන.පලාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසර ලබා ගන්න වෙනවා.17 වනදා සම්බන්ධීකරණ කමිටු රැස්වීම ඒ නිසා මාර්ග සංවර්ධන අධිකාරිය හරහාම කරගන්න කටයුතු කරන්න.ජගත් මන්ත්‍රීතුමා මාර්ග සංවර්ධන අධිකාරියට අයිති අකුරුගොඩ හතරමං හන්දිය නාමකරණය කරලා තියනවා.ඒ විදියට මාලිම්බඩ වටරවුමත් කරන්න පුළුවන් නම් හොඳයි.

**<u>යෝජනා අංක 5:28</u>**

තෙලිජ්ජවිල තොග ගබඩාව (අකුරැස්ස විවිධ සේවා සමූපකාරයට අයත්)මාලිම්බඩ සභාවට පවරා ගැනීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,තෙලිජ්ජවිල තොග ගබඩාව අකුරැස්ස විවිධ සේවා සමූපකාර සමිතියට අයිතියි කිව්වට එහි භූමියේ සම්පූර්ණ අයිතිය ඒ ආයතනය සතුව නෑ.අහංගම පැත්තෙ ඉන්න කෙනෙක්ට තමයි අයිතිය තියෙන්නෙ.එතකොට සමූපකාරය කරගෙන යද්දී මෙතන තොග ගබඩාවක් ඉස්සර පවත්වා ගෙන ගියා.දැනට සමූපකාරය පමණයි තියෙන්නෙ.විශාල භූමියක්.සභාවට පවරා ගන්න පුළුවන් නම් හොඳ ආදායම් උත්පාදන මාර්ගයක්.ඒ නිසා අවශ්‍ය කටයුතු සභාපතිතුමා සමඟ සාකච්ජා කරලා ප්‍රගතිය සමඟ ඉදිරි සභාවකදී දැනුම් දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව තෙලිජ්ජවිල තොග ගබඩාව (අකුරැස්ස විවිධ සේවා සමූපකාරයට

අයත්)මාලිම්බඩ සභාවට පවරා ගැනීමේ යෝජනාවට කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:29</u>**
තෙලිජ්ජවිල පොදු වෙළඳපොළෙහි ඇති බිම් මහලේ ඇති කඩ පේලියෙහි පලමු මහල හා දෙවන මහල ලෙස සංවර්ධනය කළ යුතු යැයි මෙම සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු වැඩබලන සභාපතිතුමනි,තෙලිජ්ජවිල පොළ භූමියේ ඇති බිම් මහල තට්ටු තුනකට ගහන්න තමයි අපි අදහස් කරේ.මාලිම්බඩ ප්‍රාදේශීය සභා මේ ගොඩනැගිල්ල හදන්න එවකට අදහසක් තිබුනෙ නෑ.මැද කොටස සභාවටත් උඩ කොටස රැස්වීම් ශාලාවකටත් තමයි අනුමත කරගත්තේ.අපිට සිද්ද වුනා පොළ හදද්දි පාරේ ඉඳලා අඩි 50ක් ඇරලා කඩ කාමර ටික හදන්න.ඒකයි එතරම් ඉඩක් ඉතුරුවෙලා තියෙන්නේ.ඔතන කලින් තිබුණෙ තේ කඩයක්.ඒ තේ කඩය සභාව විසින් මිලදී ගත්තා.මේ පොළේ සැලැස්ම මාතර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරාම මූලාසනය හොබවපු ඇමතිතුමා සඳහන් කළේ පොළක් විතරක් හදන්න කියන කාරණාව.එහි ප්‍රතිඵලයක් විදියට අපිට හම්බවුණේ පොළ පමණයි.ඕක හදනකොට බේස් එකට ඩබල් නෙට්දාලා අඩි 20 කම්බි කූරු එහෙම දාලා හදලා තියෙන්නේ.මං ඉල්ලීමක් කරනවා පුළුවන් නම් පොලේ දෙවනි තුන්වෙනි තට්ටු හදන්න අවශ්‍ය කටයුතු සූදානම් කරන්න කියලා.රජයේ කාර්යාල තියන්න තැන් හොයනවා සතියට දින දෙකයි පොළ පැවැත්වෙන්නෙ මේ යෝජනාව යථාර්තයක් කරගන්න පුළුවන් නම් හොඳ ආදායමක් ලබා ගන්න පුළුවන්.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව තෙලිජ්ජවිල පොදු වෙළඳපොළෙහි ඇති බිම් මහලේ ඇති කඩ පේලියෙහි පලමු මහල හා දෙවන මහල ලෙස සංවර්ධනය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:30</u>**
අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවට ප්‍රවේශ මාර්ගයෙහි බෝක්කුව සාදා එහි මිදුලෙහි ප්‍රාදේශීය සභා මාර්ගයන්හි ඉවත් කරනා කුට්ටිගල් අතුරා දෙන ලෙස මෙම සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**
ගරු වැඩබලන සභාපතිතුමනි,මං ස්තූතිවන්තවනවා සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ගල් ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවේ පැවති පිංකම් මාලාවට සහයෝගය ලබා දීම සම්බන්ධව.ඒ වගේම හිටපු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියලු දෙනාත් මේ අවස්ථාවේ ගෞරවයෙන් සිහිපත් කරනවා.මේ ප්‍රජා ශාලාවට සභාපතිතුමනි ප්‍රවේශ මාර්ගය පොඩි බෝක්කුවක් තියෙන්නෙ.ඒක ප්‍රමාණවත් නෑ.කොන්ක්‍රීට් ලෑල්ලක් තියෙන්නෙ ඒක ශක්තිමත් මදි.අඩි 8ක් පළලට කොන්ක්‍රීට් ලෑල්ලක් ගහන්න ඕන.ඒ

වගේම ඉල්ලීමක් කරනවා කෙහෙන්හරි ගලවලා ඉවත් කරන කැටගල් ටිකක් අල්ලලා දෙන්න කියලා මඩවල වහගන්න.බොහොම ස්තූතියි.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ප්‍රජා ශාලාවට ප්‍රවේශ මාර්ගයෙහි බෝක්කුව සාදා එහි මිදුලෙහි ප්‍රාදේශීය සභා මාර්ගයන්හි ඉවත් කරනා කුට්ටිගල් ඇතිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:31</u>**

අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාවතෙහි සමගි නිවස අසලින් ආරම්භ වී ශ්‍රම ශක්ති මාවතෙන් අවසන් වන ජල ටැංකිය පාර සංවර්ධනය කර දෙන ලෙස මෙම සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ටී.එම්.ජගත් චමින්ද කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,මේ පාර පිළිබඳව කවුරුත් දන්නවා.මේ පාර තමයි අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ග්‍රාම නිලධාරී වසමේ පවුල් 165කට වතුර දෙන්නෙ.ඩල ව්‍යාපෘතියකුත් ක්‍රියාත්මක වෙනවා.ඒක හිටපු සභාපතිතුමා හා ලේකම්තුමිය මැදිහත් වෙලා පාරක් විදියට කැපුවා.ඔබතුමාලට ප්‍රතිපාදන සපයා ගැනීමේ හැකියාව තියනවා නම් අසීරුම කොටස කැටගල් ටිකක් අල්ලලා හදලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව අකුරුගොඩ උතුර ගල්ඇන්දකුට්ටිය ප්‍රධාන මාවතෙහි සමගි නිවස අසලින් ආරම්භ වී ශ්‍රම ශක්ති මාවතෙන් අවසන් වන ජල ටැංකිය පාර සංවර්ධනය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:32</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටත් අනුපමේය මෙහෙවරක් ඉටු කොට 2025 සැප්තැම්බර් 11 දින මිය ගිය හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණාදාස පල්ලියගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝකය පල කළ යුතු යැයි මෙම සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු සභාපතිතුමනි,මේ සභාවේ මන්ත්‍රීවරයෙක් විදියට කටයුතු කළ අභාවප්‍රාප්ත කරුණාදාස පල්ලියගේ මැතිතුමා අවස්ථා දෙකකදී එ.ජා.ප මන්ත්‍රීවරයෙක් විදියට මේ සභාව නියෝජනය කරා.ඒ වගේම මහින්ද විජේසේකර ඇමතිතුමාගේ සම්බන්ධීකරණ ලේකම් විදියට කටයුතු කළා.ඒ කාලවකවානුව තුළ තමයි ධීවර අමාත්‍යාංශයෙන් ලක්ෂ 10ක ප්‍රතිපාදන ගෙනැල්ලා පුස්තකාලය ආරම්භ කළේ.ඒ වගේමයි පළවෙනි ජල

බවුසරය සභාවට ගෙනාවේ එතුමා.තෙලිජ්ජවිල පුස්තකාලෙ ඉස්සරහ බයිසිකල් දාන්න හදපු හට් එකේ තියෙන්නෙ තාම එතුහා දීපු ටකරන් කොළ ටික.ඒ වගේම විශාල පිරිසකට රැකියා අවස්ථා ලබා දෙන්න මැදිහත් වුනා.එවැනි විශාල කාර්ය භාරයක් ඉටු කරපු එතුමා ගිය මාසේ 11වෙනිදා අප අතරින් සමුගත්තා.ඒ නිසා එතුමාගේ සේවය අගේ කරලා නිවසට ලිපියක් යවන්න කටයුතු කරන්න කියන ඉල්ලීම වගේම එතුමාට අජරාමර නිවන් සුවය ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා</u>**

මන්ත්‍රීවරුනි,මමත් අවස්ථාව ලබා ගන්නවා එතුමා වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන්න.එතුමා ගැන පාලිත මන්ත්‍රීතුමා කියපු කාරණා වගේම විනීත රියදුරෙක් විදියට මං දකිනවා.පසු කාලීනව දේශපාලනයට සම්බන්ධ වුනේ.අපි දේශපාලන කඳවුරු දෙකක් නියෝජනය කරත් පොදු වැඩවලදී ඉතාම සහයෝගයෙන් දේශපාලන භේදයකින් තොරව වැඩ කළා.මමත් මේ අවස්ථාවේ එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඒ අනුව මාලිම්බඩ ප්‍රාදේශීය සභාවටත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටත් අනුපමේය මෙහෙවරක් ඉටු කොට 2025 සැප්තැම්බර් 11 දින මිය ගිය හිටපු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කරුණාදාස පල්ලියගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් ශෝක ප්‍රකාශයක් ලියාපදිංචි තැපෑලෙන් පවුලේ සාමාජිකයන් වෙත යැවීමට තීරණය විය.

**<u>යෝජනා අංක 5:33</u>**

පියද්දගොඩ -කටුවන්ගොඩ මාර්ගයේ බන්ටි වේල්ල BR8 පස් දමා ගමනාගමනය පහසු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා</u>**

ගරු වැඩබලන සභාපතිතුමනි,මා නියෝජනය කරන කද්දුව කොට්ඨාශයේ කටුවන්ගොඩ ග්‍රාම නිලදාරී වසම හූ විෂමතාව අතින් ඉතාම දුෂ්කර ප්‍රදේශයක්.වැල්ලතොට මාලිම්බඩ ප්‍රධාන මාර්ගය ගංවතුර තත්වයකදි යට වුනාම ගමන් කරන්න තියන ප්‍රධාන මාර්ගය BR 8 බන්ටි වේල්ල.වලවල් හැදිලා යන්න බැරි තත්වයට පත්වෙලා තියෙන්නේ.වාරි මාර්ගයට තමයි අයිති.සීග්‍ර බැවුමක් තියෙන්නේ ඒ නිසා ග්‍රාම නිලධාරී වසම හා සම්බන්ධ වන මාර්ගය ග්‍රාම නිලධාරී සේවයට වාර්තා කරන්න ඕනත් මේ මාර්ගය හරහා.ඒ නිසා මං ඉල්ලීමක් කරන්නෙ ගමන් කරන්න පහසු විදියට පස් ටිකක් දාලා සංවර්ධනය කරලා දෙන්න කියලා.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

ගරු වැඩ බලන සභාපතිතුමනි,මන්ත්‍රීතුමා ඉතා හොඳ යොජනාවක් කරන්නේ.මේ පාර කටුවන්ගොඩ පියද්දගොඩ මාර්ගය.වාරි මාර්ගයට අයත් වෙන්නේ.කීපවතාවක් කැටගල් අල්ලන්න ඉල්ලුවත් අවසර දුන්නෙ නෑ.සභාවෙන් අනුමත කරගෙන සමබන්ධීකරණ කමිටුවට දාලා එයාලගේ අවසරය ගන්න බලමු.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව පියද්දගොඩ -කටුවන්ගොඩ මාර්ගයේ බන්ටි වේල්ල BR8 පස් දමා

ගමනාගමනය පහසු කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:34</u>**

උනින්දුවෙල වසමේ දිගනගොඩ ප්‍රදේශවාසී ජනතාවට යාමට ඇති (සමන් රසික මහතාගේ නිවස අසල සිට උඩවත්ත ධර්මදාස මහතාගේ නිවස දක්වා)මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

**<u>ගරු මන්ත්‍රී චමින්ද කුමාර ගමාච්චි වික්‍රමසිංහ මහතා</u>**

වැඩ බලන සභාපතිතුමනි,මේ පාරත් කලින් පාර වගේම තමයි ඉතා දුෂ්කර මාර්ගයක්.දිගනගොඩට යන්න තියන මාර්ගය BR 8 තමයි ඒ වෙල්ලත්.උනින්දුවෙල පන්සල පාරෙ ගිහින් චන්දන මහත්තයාගෙ නිවස ළඟින් අඩි 4 පාරක් තියනවා.ඒ පාරෙන් තමයි පන්සලට යන්නෙ.ඒ වගේම ගමත් අතර සම්බන්ධතාවය පවත්වා ගන්නෙ.ගංවතුර තත්වයට දැඩි ලෙස භාජනය වන ප්‍රදේශයක්.ගමනාගමනය පහසු වන ලෙස සකස් කරලා දෙන්න කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා</u>**

වැඩබලන සභාපතිතුමනි,මේ පාරේ දිග මීටර් 200ක් විතර සුළු ප්‍රමාණයක්.බෝක්කු දෙකක් දාලා දැනට තියන අඩි 4ක වෙල්ල පළල් කරලා දුන්නම ගමනාගමනයට බාධාවක් නෑ.ලොකු මුදලක් යන්නෙ නෑ.මේක පහලගනේගම අසංක මහත්තයාගෙ නිවස අසලින් අවසන්වනවා.හොඳම යොජනාවක්.අපේ උපරිම සහයෝලය ලබා දෙනවා ඒ වගේම ඉල්ලීමකුත් කරනවා ඉක්මණින්ම හදලා දෙන්න කියලා.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව උනින්දුවෙල වසමේ දිගනගොඩ ප්‍රදේශවාසී ජනතාවට යාමට ඇති (සමන් රසික මහතාගේ නිවස අසල සිට උඩවත්ත ධර්මදාස මහතාගේ නිවස දක්වා)මාර්ගය සංවර්ධනය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:35</u>**

වසර ගණනාවක් සොයා ගත නොහැකිව තිබූ ඇල්ගිරිය පහළ කියාඩුව ග්‍රාම නිලධාරී වසමේ දුන්වත්තහේන ඉඩමේ පිහිටි සභාව සතු දුන්වත්ත පොදු ළිඳ ගරා වැටීමින් පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා

**<u>ගරු මන්ත්‍රී නිශාන්ත නන්දකුමාර මුණසිංහ මහතා</u>**

වැඩබලන සභාපතිතුමනි,මේ ළිඳ පිහිටලා තියෙන්නෙ ඇල්ගිරිය ග්‍රාපහළ කියාඩුව ග්‍රාම සේවා වසමේ දුන්වත්තහේන කියන ඉඩමේ කළුකඳ ළඟින් යන්න තියනවා පොඩි පාරක්.ඒ ළිඳ ප්‍රතිසංස්කරණය කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව වසර ගණනාවක් සොයා ගත නොහැකිව තිබූ ඇල්ගිරිය පහළ කියාඩුව

ග්‍රාම නිලධාරී වසමේ දූන්වත්තහේන ඉඩමේ පිහිටි සභාව සතු දූන්වත්ත පොදු ළිඳ ගරා වැටීමින් පවතින බැවින් එය ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.**

**යෝජනා අංක 6:1**

ගරු මන්ත්‍රී හෂිත සුබෝධන මාරතුඩුවගේ මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී ඩී.කේ.පියදාස විජයරත්න මහතා

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව ගරු මන්ත්‍රී හෂිත සුබෝධන මාරතුඩුවගේ මන්ත්‍රීතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:2**

කුරුඳු වගාව සම්බන්ධ න්‍යායාත්මක පුහුණු වැඩසටහන පැවැත්වීමට අදාළ රු.142,500.00ක වියදම් ඇස්තමේන්තුව හා වැඩසටහනෙහි ශක්‍යතා අධ්‍යන වාර්තාව හා සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

**ගරු මන්ත්‍රී ජී.පී උදය සාන්ත මහතා**

වැඩබලන සභාපතිතුමනි,මාලිම්බඩ ප්‍රදේශය කුරුඳු වගාවට හොඳ දේශගුණික තත්වයක් තියන ප්‍රදේශයක්.පිරිස තෝරාගැනීමේදී ආර්ථික සංවර්ධන නිලධාරීගෙන් වගා කරුවන් පිළිබඳ තොරතුරු අරගෙන සැබෑ ලෙසම කුරුඳු වගාවේ නියැලෙන පිරිසට තමයි මේ පුහුණුව ලබා දිය යුත්තේ.ඒ වගේම මේ ප්‍රදේශයේ හොඳම කුරුඳු ගැනුම්කරුවා ඉන්නෙ අකුරැස්ස සමඟි ආයතනය.ඔවුන්ට ඉල්ලීමක් කරොත් මේ සඳහා අනුග්‍රහය ලබා දෙන්න කියලා අනිවාර්යෙන්ම සම්බන්ධ වෙයි.ඔවුන්ටත් මේක හොඳ අවස්ථාවක් වෙයි.හොඳ යොජනාවක් නිසි අධ්‍යයනයකින් යුතුව මේ වැඩසටහන සාර්ථක කරගන්න කියලා කියනවා.බොහොම ස්තූතියි.

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව කුරුඳු වගාව සම්බන්ධ න්‍යායාත්මක පුහුණු වැඩසටහන පැවැත්වීමට අදාළ රු.142,500.00ක වියදම් ඇස්තමේන්තුව හා වැඩසටහනෙහි ශක්‍යතා අධ්‍යන වාර්තාව හා සාධාරණීකරණ වාර්තාව අනුමත කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:3**

දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් SPRPTA/MT/21 අංක යටතේ එවන ලද ලිපියට අනුව ප්‍රතිසංස්කරණය කොට දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන

අධිකාරිය වෙත ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට යෝජිත පහත බස් නැවතුම්පොළවල් ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි

i. තෙලිජ්ජවිල මන්සන්දියෙන් අකුරැස්ස මාර්ගයේ පවතින බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම
ii. වෙනිඅකුල සෙන්ට්‍රල් පාර්ක් පිවිසුම ඉදිරිපිට පවතින(වෙරළු ගස අසල)බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම
iii. උනින්දුවෙල පන්සල ඉදිරිපිට ප්‍රධාන මාර්ගයේ පවතින බස් නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම
iv. නාගොඩ අධිවේගී ප්‍රවේශ මාර්ගය ආසන්නයේ පවතින බස් නැවතුම්පොළෙහි වහලය සකස් කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම
v. නාගොඩ හන්දියෙන් අකුරැස්ස දෙසට රන්දිය ග්‍රොසරි අසල බස් නැවතුමෙහි වහලය පිරිසිදු කොට තීන්ත ආලේප කිරීම.
vi. නාගොඩ හන්දියෙන් මාතර දෙසට බස් නැවතුම පිරිසිදු කොට තීන්ත ආලේප කිරීම හා අවට පස් ඉවත් කර පිරිසිදු කිරීම.

යෝජනා කළේ :-ගරු උපසභාපති කේ.ජී සමන් කුමාර මහතා
ස්ථිර කළේ :-ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා

ඉහත යෝජනාව සඳහා ගරු වැඩබලන සභාපතිතුමා විසින් ඡන්දය විමසීම සිදු කරන ලදී.ඒ අනුව දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් SPRPTA/MT/21 අංක යටතේ එවන ලද ලිපියට අනුව ප්‍රතිසංස්කරණය කොට දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත් කිරීමට යෝජිත පහත බස් නැවතුම්පොළවල් ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනාවට පැමිණ සිටින සභිකයන්ගේ කිසිවකු විරෝධතාවයක් නොදැක්වීම හේතුවෙන් ඒකමතිකව සහා සම්මත විය.

## 7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම - නැත

## 8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.

සැප්තැම්බර් මස ගිණුම් වාර්තා සභාවට ඉදිරිපත් කරන ලදී.

## 9) වෙනත් කරුණු

<u>**ගරු මන්ත්‍රී පී.ජී පාලිත කුමාර මහතා**</u>

ගරු වැඩබලන සභාපතිතුමනි,කිලෝ මීටර් ලක්ෂෙ ව්‍යාපෘතිය යටතේ මාලිම්බඩ සෙන්ට්‍රල් පාර්ක් ඉඩමේ මර්ග කාපට් කළා.එහිදී ස්ථාන කිහිපයක් හඳුනා ගත්තා දැඩි ලෙස නාය යෑමට ලක්වෙයි කියලා.සෙන්ට්‍රල් පාර්ක් ඇතුළු වෙල මීටර් 50ක් ගිය තැන එස්.එම්.සමරවික්‍රම මහත්මියට අයත් නිවසේ තත්වය පිළිබඳ ඔබ සියලු දෙනා දැනුවත් ඇති.මේ පාර හදන්න පාර කැපුවේ RD එකෙන්.මෙතන මුල පැති බැම්ම අඩි 6ක් 7ක් විතර යටට හාරලා පළල අඩි 4ක් වෙන්න උඩට අඩි 3ක් විතර වෙන්න හදාගෙන ආවා.එහා ගෙදර පැති බැම්ම සම්පූර්ණ නිමාවට පත් කළා.මේ පැති බැම්ම අවසන් කරන්න පුළුවන්කමක් ලැබුණෙ නෑ.ඒකට හේතු කීපයක් තියනවා.NBRO වාර්තාව අනුව අනිවාර්යෙන්ම පැති බැම්ම දැමිය යුතුයි කියලා තමයි තියෙන්නේ.මේ සමරවික්‍රම මහත්මියගේ නිවසට දැඩි හානියක් සිදු වෙමින් පවතිනවා.ගරු සභාපතිතුමාට අවශ්‍ය ලිපි යොමු කරලා තියනවා.ඒ වගේම පැති බැම්ම දැමීම සුදුසුයි කියලා සෙන්ට්‍රල් පාර්ක් ඉඩම් හිමියො අත්සන් සහිත ලිපිය මේ වෙලාවේ සභාගත කරනවා.හදන්න බැරි නම්

RD එකෙන් කැඩුවේ ඇයි කියලා අහනවා වගේම අපි තොරතුරු දැනගැනීමේ පනත ඉල්ලීමක් කළා එහිත් සඳහන් වෙන්නෙ මේ පැති බැම්ම දැමීම සුදුසුයි කියන කාරණාව.අපි ඉල්ලීමක් කරනවා ඔවුන් විසින් කඩලා වැඩ නතර කරපු මේ පැති බැම්ම හදලා දෙන්න කියලා.

ගරු වැඩබලන සභාපතිතුමාගේ ස්තූති කථාවෙන් පසු ප.ව 4.30 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව